# සංක්ෂිප්තය.

කළමනාකරණය පිළිබඳ අධ්‍යාපනපති උපාධිය සඳහා ඉදිරිපත් කෙරෙන ස්වාධීන පර්යේෂණ නිබන්ධනයේ පර්යේෂණ සංක්ෂිප්තය මෙහි දැක්වේ. ඵලදායි ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලියක් සඳහා වත්මන් පාසල් පන්ති කාමර කළමනාකරණ ක්‍රමශිල්ප ගුරුවරයා විසින් විධිමත් ආකාරයෙන් භාවිතයට ගන්නේ ද යන්න පිළිබඳ සොයා බැලීම උක්ත පර්යේෂණයේ මූලික පරමාර්ථය විය. මෙම පරමාර්ථය ඉටුකර ගැනීම සඳහා පර්යේෂකයා විසින් පහත සඳහන් පර්යේෂණ අරමුණු පිහිටුවා ගන්නා ලදි.

01. පන්ති කාමර කළමනාකරණ ක්‍රමශිල්ප පිළිබඳ ගුරුවරයාගේ දැනුම සොයා බැලීම.

02. ප්‍රායෝගික ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය තුළ පන්ති කාමර කළමනාකරණ ක්‍රමශිල්ප ගුරුවරයා විසින් කොතෙක් දුරට භාවිතයට ගන්නේදැයි සොයා බැලීම.

03. ගුරුවරයා විසින් යොදාගන්නා පන්ති කාමර කළමනාකරණ ක්‍රමශිල්ප සාර්ථක පන්ති කාමර කළමනාකරණයකට ඉවහල් වන්නේදැයි සොයා බැලීම.

04. පන්ති කාමර කළමනාකරණ ක්‍රමශිල්ප ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය හා ගළපාගැනීමේ දී පැණ නැගී ඇති ගැටලු අඩුපාඩු දුෂ්කරතා හඳුනා ගැනීම.

05. ගුරුවරු පන්ති කාමර කළමනාකරණ ක්‍රමශිල්ප ඵලදායිව යොදාගැනීමට, යොදා නොගැනීමට හේතු සොයා බැලීම.

පර්යේෂකයා විසින් පිහිටුවා ගන්නාලද සුවිශේෂී අරමුණු සොයා බැලීම විස්තරාත්මක පර්යේෂණ ක්‍රමවේදය යටතේ වන නියැදි සමීක්ෂණ අධ්‍යයනයක් වශයෙන් සිදු කෙරිණි. ගුරු සිසු විදුහල්පති ගුරු උපදේශක සහ විෂය අධ්‍යක්ෂවරුන්ගෙන් සැදුම්ලත් අධ්‍යයන නියැදිය සියයකගෙන් සමන්විත වූ අතර සහේතුක නියැදිය ඒ සඳහා භාවිත කෙරිණි. මෙහිදී කුරුණෑගල දිස්ත්‍රික්කයේ මහව අධ්‍යාපන බල ප්‍රදේශය අධ්‍යයන නියැදිය තෝරාගැනීම සඳහා යොදාගන්නා ලදි. එසේ වුව ද අදාළ අධ්‍යයනය, මහව අධ්‍යාපන බල ප්‍රදේශයේ පර්යේෂකයා විසින් තෝරාගන්නා ලද අධ්‍යාපන කොට්ඨාස දෙකක තෝරාගත් පාසල් හයක් ඇසුරින් සම්පූර්ණ කෙරිණි.

පර්යේෂකයා විසින් තෝරාගන්නා ලද පාසල් හයෙහි ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලියේ නිරත තෝරාගත් ගුරුවරුන් 44 දෙනෙකු සහ සිසුන් 30 දෙනෙකුගෙන් ද විදුහල්පතිවරුන් හය දෙනෙකුගෙන් ද අධ්‍යයනයට අවශ්‍ය දත්ත සහ තොරතුරු ලබා ගැණිනි. ඊට අමතරව ගුරු උපදේශකවරුන් 8 ද විෂය අධ්‍යක්ෂවරුන් 10 ද අධ්‍යයනයට සහභාගී කරගැණිනි. එහිදී අධ්‍යයනයට අදාළ කොටගත් පාසල් හයෙහි 9,10,11 ශ්‍රේණි ආශ්‍රයෙන් තෝරාගත් පන්ති කාමර 30 ක් තුළ අධ්‍යයනය ක්‍රියාත්මක කරන ලදි. මෙහිදී සෘජු පන්ති කාමර නිරීක්ෂණය, ප්‍රශ්නාවලි භාවිතය සහ සම්මුඛ සාකච්ඡා යනාදී පර්යේෂණ උපකරණ මගින්, පර්යේෂකයා විසින් අධ්‍යයනයට අවශ්‍යය දත්ත ලබාගන්නා ලදි. අදාළ මිනුම් උපකරණ පර්යේෂකයා විසින් සකස් කරගත් මිනුම් උපකරණ වූ හෙයින් එම මිනුම් උපකරණ අධ්‍යයන සඳහා ගැලපෙන උපකරණ ලෙස සකස්කරගැනීම නියාමක පරීක්ෂණ පැවැත්වීම මගින් සිදුවිය. මිනුම් උපකරණ යෝග්‍ය කරගැනීමේ නියාමක පරීක්ෂණ පැවැත්වීම අධ්‍යයනයේ සියලු පාර්ශවකරුවන් නියෝජනයවන පරිදි සිදු විය. අධ්‍යයන පාර්ශවකරුවන් 14 දෙනෙකු නියාමක පරීක්ෂණය සඳහා සහභාගී කර ගැනුනු අතර එම සංඛ්‍යාව සමස්ත නියැදියෙන් සියයට 15 ක අගයකි.

පන්ති කාමර නිරීක්ෂණය, අධ්‍යයනය සඳහා දත්ත ලබා ගැනීමේ ප්‍රධානතම ක්‍රමශිල්පය ලෙස යොදා ගැණිනි. පර්යේෂකයා විසින් සකස්කරන ලද නිරීක්ෂණ නියමාවලිය සුවිශේෂී ක්ෂේත්‍ර 40 ක් සඳහා අවධානය යොමුකළ අතර එම ක්ෂේත්‍ර 40 අධ්‍යයනයේ සුවිශේෂී අරමුණු පහ ඔස්සේ පෙලගස්වන ලදි. එම නිරීක්ෂණ පත්‍රිකාව අතැතිව කාලපරිච්ඡේද 30 දී පන්ති කාමර 30 ක් තුළ රැඳී සිටිමින් පර්යේෂකයා විසින් දත්ත එක්රැස් කෙරිණි. අධ්‍යයනයේ දත්ත ලබා ගැනීම සඳහා ප්‍රශ්නාවලි තුනක් භාවිතා කරන ලදී. ගුරු ප්‍රශ්නාවලිය, සිසු ප්‍රශ්නාවලිය සහ ගුරු උපදේශක විදුහල්පති විෂය අධ්‍යක්ෂවරුන් සඳහා වූ ප්‍රශ්නාවලිය එම ප්‍රශ්නාවලි තුනයි. සම්මුඛ සාකච්ඡා නියමාවලිය සඳහා විදුහල්පතිවරුන් විෂය අධ්‍යක්ෂකවරුන් සහ ගුරු උපදේශකවරුන්ගෙන් කරුණු විමසීමක් සිදුකළ අතර එම කාර්යය සේවාකාලය තුලදී ද ඉන් බැහැරව ද සම්පූර්ණ කිරීම සිදුවිය. මෙහිදී පර්යේෂණයට අදාළ නියැදිය සමන්විත වූ අධ්‍යාපන බල ප්‍රදේශයේ බලධරයා වූ මහව කලාප අධ්‍යාපන අධ්‍යක්ෂවරයාගේ අවසරය සහිත ලිපිය උපයෝගී කරගනිමින් තෝරාගන්නා ලද විද්‍යාලයන්හි විදුහල්පතිවරුන්ගේ සහ අධ්‍යයන පාර්ශවයන්හි අවසරය මත අදාළ තොරතුරු ලබාගන්නා ලදි.

පන්ති කාමර කළමනාකරණය පිළිබඳ ගුරුවරයාගේ දැනුම සොයාබැලීම ශීර්ෂ හතරක් යටතේ සිදු කෙරිණි. එහිදී නිරීක්ෂණ නියමාවලිය ප්‍රධාන මිනුම් උපකරණය වශයෙන් යොදා ගැණිනි. එයට අමතරව ගුරු සිසු අදහස් විමසුම සහ විදුහල්පති ගුරු උපදේශක සහ විෂය අධ්‍යක්ෂවරුන්ගේ අදහස් විමසීම මෙහිදී සිදුකරන ලදි. පන්ති කාමර කළමනාකරණ ක්‍රමශිල්ප ගුරුවරයා විසින් කොතෙක් දුරට භාවිතයට ගන්නේදැයි සොයා බැලීම සහ ගුරුවරයා විසින්

යොදාගන්නා පන්ති කාමර කළමනාකරණ ක්‍රමශිල්ප සාර්ථක පන්ති කාමර කළමනාකරණයට ඉවහල් වන්නේදැයි සොයාබැලීම ඉහත පළමු අරමුණ සොයාබැලූ ආකාරයෙන්ම සම්පූර්ණ කෙරිණි. එසේ වුව ද එහිදී යොදාගන්නාලද නිරීක්ෂණ සාධක සහ සුවිශේෂී සාධක පළමු අරමුණ සොයා බැලීම සඳහා යොදාගත් ඒවායින් වෙනස් විය. ගුරු සිසු විදුහල්පති ගුරු උපදේශක විෂය අධ්‍යක්ෂවරුන්ගේ අදහස් විමසුමෙන් සහ ප්‍රශ්න පිළිතුරු විශ්ලේෂණය මගින් පන්ති කාමර කළමනාකරණ ක්‍රමශිල්ප ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය හා ගළපාගැනීමේ දී පැන නැගී ඇති ගැටලු අඩුපාඩු දුෂ්කරතා හඳුනා ගැණිනි. අධ්‍යයනයේ අවසන් අරමුණ වශයෙන් පිහිටුවා ගන්නාලද ගුරුවරු පන්ති කාමර කළමනාකරණ ක්‍රමශිල්ප ඵලදායීව යොදාගැනීමට, යොදා නොගැනීමට හේතු සොයා බැලීම ඉහත හතරවන අරමුණ සොයාබැලූ ආකාරයෙන්ම සම්පූර්ණ කෙරිණි. අධ්‍යයනයේ දත්ත විශ්ලේෂණය සඳහා සරල සංඛ්‍යා විද්‍යාත්මක විශ්ලේෂණ ක්‍රමය යොදා ගැණිනි. මෙහිදී දත්ත වගුගත කරමින් ප්‍රතිශත ආශ්‍රිතව කාණ්ඩගත කරමින් නාමික පරිමාණයෙන් දත්ත ඉදිරිපත් කිරීම ද, නිරීක්ෂණ නියමාවලිය සහ අදහස් විමසුම් ප්‍රශ්නාවලි තුළින් තරා පැවරීමක් ද සිදුකර ඇත. උක්ත සඳහන් දත්ත කාණ්ඩ ගත කිරීමට හා තරා කිරීමට අමතරව කාණ්ඩ අතර වෙනසෙහි ප්‍රමාණය දැක්වීම ද දත්ත විශ්ලේෂණය තුළින් සිදුකර තිබේ. අධ්‍යයනයේ දත්ත ඉදිරිපත් කිරීම විශ්ලේෂණය සහ අර්ථකථනයේ දී, ප්‍රතිශතක සහ වගු භාවිතය බහුල වශයෙන් යොදාගෙන තිබේ.

මෙම අධ්‍යයනය ප්‍රධාන පරිච්ඡේද පහක් යටතේ පෙළ ගස්වා තිබේ. එහි පළමුවැනි පරිච්ඡේදය යටතේ සමස්ත අධ්‍යයනය පිළිබඳ හැඳින්වීම ඉදිරිපත්කර ඇත. දෙවන පරිච්ඡේදය සාහිත්‍යය විමර්ශනය සඳහා වෙන්කර තිබේ. තුන්වන පරිච්ඡේදයෙන් අධ්‍යයන ක්‍රම පිළිවෙත හා සැලැස්ම සවිස්තරාත්මකව දක්වා ඇත. අධ්‍යයනයේ හතරවන පරිච්ඡේදය, දත්ත ඉදිරිපත් කිරීම විශ්ලේෂණය හා අර්ථකථනය සඳහා වෙන් වූ අතර පස්වැනි පරිච්ඡේදය තුළින් නිගමන සහ යෝජනා ඉදිරිපත්කර තිබේ. අධ්‍යයනය තුළ පර්යේෂකයා විසින් පිහිටුවා ගන්නාලද පර්යේෂණ අරමුණුවලට අනුව යමින් නිගමන සහ යෝජනා ඉදිරිපත් කර ඇත. එහිදී පන්ති කාමර කළමනාකරණ ක්‍රමශිල්ප පිළිබඳ ගුරුවරයාගේ දැනුම හොඳ මට්ටමක පැවති බව පර්යේෂණ ප්‍රතිඵලවලට අනුව නිගමනය විය. ගුරුවරයා විසින් යොදාගත් පන්ති කාමර කළමනාකරණ ක්‍රමශිල්ප සාර්ථක පන්ති කාමර කළමනාකරණයක් සඳහා ඉවහල් නොවූ බව ද පැහැදිලි විය. පන්ති කාමරය සතු සම්පත් ප්‍රමාණවත් නොවූවද පිරිමසාගතහැකි මට්ටමක පැවතිනි. පන්ති කාමර තුළ සිටින බහුතර සිසුන් ප්‍රමාණයක් ඉගෙනුම් ක්‍රියාවලිය සඳහා කැපවූවන් නොවූ බව පැහැදිලි විය. ධනාත්මක ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලියක් සඳහා යොදා ගතහැකිව තිබූ සම්පත් පවා ගුරුවරුන් විසින් ඵලදායී ලෙස යොදා නොගත් බව ද පර්යේෂණය තුළින් අනාවරණය විය.